## ‘පට්ඨාන’ දහතුන්වැනි දේශනාව

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස

තුන් ලෝකයට මහා කරුණාවෙන් පිහිට වී වදාළා වූ සර්වඥතාඥානයෙන් සමන්නාගත වූ මහා කරුණාසමාපත්ති ඥානයෙන් සමන්නාගත වූ දසබලධාරී වූ චතු විශාරද වූ ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන්වහන්සේට තමන්වහන්සේගේ සන්තානයේ සියලුම ක්ලේශ ධර්මයන් නැසුවා වූ ක්ලේශ ධර්මයන් පලවා හැරියාවූ සංසාරයට බන්ඳවන්නාවූ සංසාර චක්‍රයේ කෙලෙස් අර සිඳ බිඳ දැමුවාවූ සියලුම ලෝකසත්වයාට කරුණාවෙන් ධර්ම දේශනා කරන්නාවූ ඒ නිසාම උන්වහන්සේ වැඳුම් පිදුම් වලට සුදුසු වන්නාවූ ගුණයෙන් යුක්තවූ ශාන්තිනායක සම්මාසම්බුදු රජාණන්වහන්සේට මේ ධර්ම සාකච්ඡාව ආරම්භ කිරීමට ප්‍රථමයෙන් ගුණ සිහිපත්කොට මම වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාර වේවා!

ඒ සම්මා සම්බුදු රජාණන්වහන්සේගේ සන්තානයේ කෙලෙස් ගිනි නිවුවාවූ ඒ අති මධුර වූ ශ්‍රී සද්ධර්මස්කන්ධයට උන්වහන්සේ අවබෝධ කරගත්තාවූ දේශනාකොට වදාළා වූ ශ්‍රී සද්ධර්මස්කන්ධයට මම නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

අෂ්ඨාර්ය පුද්ගල මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයට ධම්ම රත්නයට සංඝ රත්නයට වන්දනා කිරීමේ කුසල බලයෙන් බුදුගුණ සිහිපත් කිරීමේ කුසල බලයෙන් සහ බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයේ අනන්ත අප්‍රමාණ ගුණආනුභාව බලයෙන් මේ පිංවත් ධර්මය අහන්ට සැදී පැහැදී පෙළ ගැසී සිටින්නාවූ සියලු දෙනාට අදත් මේ කියාදෙන්නාවූ ධර්ම කරුණු ටික වැටහේවා තේරේවා! තේරුම් ගන්ට ශක්තිය ලැබේවා! ඒවාගේම ඒ සඳහා අවශ්‍ය කරන්නාවූ ශ්‍රද්ධා ගුණය වැඩේවා - බුදුරජාණන්වහන්සේ කෙරෙහි ධර්මය කෙරෙහි සංඝ රත්නය කෙරෙහි. ඒ වාගේම මේ කියල දෙන කරුණුටික කෙරෙහි සිහිය මතුවේවා! කුසල වීර්ය හදාගෙන සමාධි ගත හිතකින් මේ ධර්මය අසාගෙන ප්‍රඥාවෙන් අවබෝධ කරගන්ටත් ලැබේවා! මේ ධර්මය ඇසීම මේ ධර්මය හිතීම මේ ධර්මය මෙනෙහි කිරීම සැමදෙනාටම නිවන් මාර්ගයක් ධර්ම මාර්ගයක් කෙලෙසුන්ගෙන් මිදී යන්නාවූ මාර්ගයක් වේවා කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. ඒ ප්‍රාර්ථනාවත් එක්ක මේ පින්වතුන්ට අදට ගැලපෙන ධර්ම කොට්ඨාසයක් කියල දෙන්ට අපි මේ කාලය යොදා ගන්නවා.

අද මම කල්පනා කලා මේ පිංවත් සැම දෙනාටම තවත් අලුත් ධර්ම කොට්ඨාසයක් මේ පට්ඨාන දේශනාව අනුසාරයෙන් කියල දෙන්න. අපි නැවත සිහිගන්වා ගන්ට ඕනෑ මේ දවස්වල අපි කථාකරන්නේ බුදුරජාණන්වහන්සේ දේශනාකොට වදාළ ඒ ධර්මසකන්ධයේ ‘පට්ඨානය’ - එහෙම නැත්නම් නොයෙක් හේතු කාරණා ඉදිරිපත්වීම නිසා ‘ඒ ධර්ම තවත් ධර්ම වලට උපකාර වෙන - බලපෑම් කරන ආකාරය පිළිබඳව කියල දෙන්නාවූ ධර්ම

කොට්ඨාසයට - එහෙම නැත්තනම් ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳව'. එහෙම නැත්නම් ප්‍රත්‍යය ධර්ම 24 ක් තිබෙන බව අපි අහල තිබෙනවා - මීට කලිනුත් දැන ගත්තා. අපි මුල් පාඩම් වලිනුත් මේ කරුණු කියල දීල තිබෙනවා.

අද මේ පින්වතුන්ට කියල දෙන්ට මම හිතාගත්තේ පට්ඨාන ධර්ම කොට්ඨාසයේ කියවෙන්නාවූ 6 වෙනි ප්‍රත්‍යය ධර්මය ඒ තමයි 'සහජාත ධර්මය'. මීට පෙර අවස්ථාවලදි කියපු දේවල් - අපි පට්ඨාන ධර්ම එහෙම නැත්නම් ප්‍රත්‍යය ධර්ම 5 ක් මේ පින්වතුන්ට කියල දුන්නා. 'හේතු ප්‍රත්‍යය' – 'ආරම්මණ ප්‍රත්‍යය' – 'අධිපති ප්‍රත්‍යය' – 'අනන්තර ප්‍රත්‍යය' 'සමනන්තර ප්‍රත්‍යය' කියන ප්‍රත්‍යය ධර්ම ගැන. අද හය වෙනි සහජාත ප්‍රත්‍යය ධර්මය කියන්නේ. භාෂාව පිළිබඳව යම් යම් ගැටළු සහගත තැන් තියෙනවා නම් ඒවත් නිරවුල් කරගන්ට ඕනෑ ධර්මය තේරුම් ගන්ට. ඒක ඉතාමත් හොඳ පිහිටක් වෙනවා රුකුලක් වෙනවා උපකාරයක් වෙනවා. මේ ධර්මය අහගෙන ඉන්නාවූ සියලුම දෙනා ධර්මය හොයාගෙන මෙනෙහි කිරීමට සැදී පැහැදී පෙළ ගැසී ඉන්න පිරිසක්. පළමුකොටම මතක් කරන්ට ඕනෑ අපි මධ්‍යම ප්‍රමාණයෙන් ධර්ම සංකලනයක් අරගෙන තමයි - ධර්ම එක්කාසුවක් අරගෙන තමයි මේ ධර්ම කරුණු ටික කථා කරන්නේ. තමන්ටම ආවේනික ලක්ෂණයක් ධරාගෙන - ඒ ලක්ෂණය වෙනත් ධර්මයක් එක්ක පොදුවේ සම්බන්ධ කරගන්නේ නැතුව තමන්ටම අවේනික වූ - වෙනස් වූ ධර්මයක් ධරාගෙන තිබෙන - ක්‍රියාත්මක වෙන ධර්ම සමූහයක් - ධර්ම පොදියක් - දහම් මිටියක් තිබෙනවා. ඒවා වර්ගකර ගත්තා දේශනා අනුසාරයෙන්.

සිත කියන ධර්මය - චෛතසික - රූප ධර්මය - නිර්වාණ ධර්මය. මේ චිත්ත - චෛතසික - රූප නිර්වාණ කියන ධර්ම කොටස් හතරෙන් සංසාරය සකස් වෙලා තිබෙන්නේ - සංසාරයේ සකස් වෙලා - සංසාරයේ ක්‍රියාත්මක වෙලා පවතින්නේ - යන්නේ ධර්මතා තුනකින්. ඒ තමයි - සිත් කියන ධර්මයයි - චෛතසික ධර්මයි - රූප ධර්මයි එකට ගොනුවෙලා - එක්කාසුවෙලා - මිටි ගැහිලා - ඒවා තවත් ඒ වර්ගයේම ධර්ම වලට බලපෑම් කරමින් - ඒවාගේම ඒවගෙන් තව ධර්ම හදමින් - ඒවාගෙන්ම උපකාර ලබමින් - හේතු ප්‍රත්‍යය ධර්ම බවට පත්වෙලා - හේතු ඵල ධර්ම රාමුවේ කැරකි කැරකී - සුළි හැදි හැදී - ගුලි වෙවී - ඒවගේම ඇඹරෙමින් මේ සංසාරය ක්‍රියාත්මක වෙනවා - පැවතීම සිද්ධ වෙනවා, ධර්මතා තුනකින්. ඒ තමයි චිත්ත - චෛතසික - රූප කියන ධර්ම කොටස්.

බුදුරජාණන්වහන්සේ දේශනා කරපු - අගේ කරපු ධර්මය තමයි නිර්වාණ ධර්මය. බුදුරජාණන්වහන්සේ අවබෝධ කරගත්ත ධර්මය නිර්වාණ ධර්මය. නිර්වාණ ධාතුව. මේ නිර්වාණ ධාතුවේ සිත් නෑ. නිර්වාණ ධාතුවේ චෛතසික ධර්ම නෑ. නිර්වාණ ධාතුවේ රූප නෑ. එතකොට මේ බුදුරජාණන්වහන්සේ උතුම් ධර්මයක් -ශ්‍රේෂ්ඨ ධර්මයක් - සූක්ෂම ධර්මයක් - ප්‍රනීත ධර්මයක් - විවේකී ධර්මයක් හැටියට - උතුම් ආර්ය ධර්මයක් හැටියට සඳහන් කරන්නේ නිර්වාණ ධාතුව. අපි සැම දෙනාම බණ අහන්ට ඕනෑ - බණ හිතන්ට ඕනෑ - මෙනෙහි කරන්ට ඕනෑ - සැමදෙයක්ම කරන්ට ඕනෑ අර නිර්වාණ ධාතුව කියන හිතත් චෛතසිකත් රූපත් නැති තැනට පත්වෙන්ට.

එහෙම තියෙද්දී - ඒ නිර්වාණ ධාතුව - නිර්වාණ ධාතුව අගේ වෙච්ච - නිර්වාණ ධාතුව අගේ කරපු - නිර්වාණ ධාතුව උතුම් කොට සලකපු - ඒ නිර්වාණ ධාතුව උතුම් කොට දේසනා

කරපු බුදුරජාණන්වහන්සේ මේ නිර්වාණ ධාතුවේ මේ ටික නෑ - චිත්ත - චෛතසික - රූප නෑ, ඒ චිත්ත චෛතසික රූප නැති නිසාම නිවිච්ච තැනක් - චිත්ත චෛතසික රූප නැති නිසාම හේතු නැති තැනක් - චිත්ත චෛතසික රූප නැති නිසාම ඵල නැති තැනක්. ඒවගේ තැනක් අගය කරලා තියෙත්දී මේ නරකයි - හොඳ නෑ - සංසාර ගතයි - සංසාරයේ ක්‍රියාත්මක වෙනවා - සංසාරයේ හේතු ඵල ධර්මසමූහයේ ක්‍රියාත්මක වෙනවා - ඉතින් මේ වටිනාකමක් දීල නැති - දුකයි සමුදයයි කියල වැඩිපුර කථා කරපු මේ ධර්ම පිළිබඳව ඇයි අපි හිතන්නේ. ඇයි අපි මෙනෙහි කරන්නේ - ඇයි අපි සලකන්නේ - ඇයි අපි අහන්නේ කියල අපිට ප්‍රශ්න ඇතිවෙනවා. ඉතින් නිර්වාණ ධාතුව අවබෝධ කර ගන්ට නම් ඇයි මේවා - ඇයි මේ බුදුරජාණන්වහන්සේගේ හිතට ගැලපෙන - බුදුරජාණන්වහන්සේගේ නුවණට අහුවෙන - බුදුරජාණන්වහන්සේට පමණක් අවබෝධවනවා කියන මේ ධර්ම කොටස් ඇයි අපි මේ අහන්නේ - හිතන්නේ - මෙනෙහි කරන්නේ - අපේ කාලේ අපරාදේ යනවා නේද? අපේ නිවන් මඟ දික්වෙනවා නේද ? කියල යම් යම් අය ප්‍රශ්න නොඅහ ප්‍රශ්න අහනවා. එහෙම අවස්ථාවන් තියෙනවා. මෙතැනට උත්තරයක් මෙතනම තියෙනවා. ඒ ටිකත් කියල තමයි අද අපි මේ ධර්මය හිතන්ට බහින්ට ඕනෑ වෙන්නේ.

සිත් 89 ක් තියෙනවා කියල කිව්වා. චෛතසික ධර්ම 52 ක් තියෙනවා කියල කිව්වා. රූප ධර්ම 28 තියෙනවා කියල කිව්වා. නිර්වාණ ධාතුවයි. නිවන් අවබෝධ කරගන්ට යන නිවන් ගමනේ අපිට නිවන් අවබෝධ කරගන්ට උපකාරවන ධර්ම ටික තියෙන්නේ නිවන පැත්තේ නෙමෙයි, නිවන් අවබෝධ කරගන්ට හේතුවන ධර්ම ටික තියෙන්නේ නිවන පැත්තේ නෙමෙයි. මෙහා පැත්තේ තියෙන්නේ. චිත්ත චෛතසික රූප කියන ඒවාමෙහා පැත්තේ තියෙන්නේ. ඒක නිසා ඒවා හේතු ඵල ධර්මයේ එක තැනක කාණ්ඩ ගත කරලා තියෙනව. ඒ කියන්නේ ආර්ය මාර්ග හතරයි - ඵල හතරයි. එහෙම නැත්නම් මාර්ග සිත් හතරයි ඵල සිත් හතරයි - මේ මාර්ග සිත් ඵල සිත් හතරෙන් තමයි අපි මෙතනින් එහාපැත්තට ඇත්ත වශයෙන්ම ගොඩවෙන්නේ. ඒක නිවන් පැත්තේ නෑ. දැන් නිවන් දක්කයින් පස්සේ සෝවාන් මාර්ගයේවත් රැඳෙන්නේ නෑනේ. සකෘදාගාමී මාර්ග සිතවත් ඵල සිත්වත්, අනාගාමී මාර්ග - ඵල සිත්වත්, අරහත් මාර්ග - ඵල සිත්වත් මොකක්වත් රැඳෙන්නේ නෑ. හැබැයි හේතු ඵල ධර්මයන් ක්‍රියාත්මක වෙනවා මෙතනත්. ඉතින් මේ හේතු ඵල ධර්ම රාශියකම තිබෙන්නාවූ කොට්ඨාසයකින් තමයි නිර්වාණ නමැති ධර්මය අපි අවබෝධ කරගන්නේ. ඒක නිසා මේ නිවන් අවබෝධ කරගැනීමට තරම් ශක්තිමත් වූ ප්‍රභාෂ්වර වූ දියුණු උනාවූ මනසක් කෙනෙකුට නෑ. එහෙම තියෙනවනම් ඒ අය මේ වෙනකොට සෝවාන් සකෘදාගාමී අනාගාමී අරිහත් මාර්ග වලින් ඒ අය නිවන් දැකල. ඒක නිසා මේ නැති අය - මේකෙන් කියන්නේ නෑ ඔක්කෝටම නෑ කියල. මේ නිවන් අවබෝධ කරගන්ට තරම් ශක්තියක් නැති අය ගැන කියන්නේ. දැන් බුද්ධකාලේ අයත් බණ භාවනා කරන අයත් නෙවෙයි මේ කියන්නේ. දැන් අපිට ඒ නිවන් අවබෝධ කරගන්ට නිවන් පෙනෙන - නිවන් දකින - නිවන් දැනෙන - නිවන් අහුවෙන මහා ප්‍රඥාවක් තියෙන්ට ඕන. ඒක සූක්ෂමයිනේ - නිර්වාණ ධාතුව. ඒ සූක්ෂම වූ ප්‍රභාෂ්වර වූ සියුම් වූ ධර්මය තෙරුම්ගන්ට - අවබෝධ කරගන්ට සුදුසු නුවණක් - සුදුසු ප්‍රඥාවක් - ශක්තිමත් වූ ප්‍රඥාවක් - නුවණක් අපිට තියෙන්න ඕන. ඒ නුවණ ලබන්ට හේතු වෙන්නාවූ දෙයක් තමයි බණ ඇසීම. බණ අසනකොටත් ඒ ධර්ම කාණ්ඩ වල තිබෙන සමහර ධර්ම කොටස් අහන කොට ශ්‍රද්ධාව හිතේ මතුවෙවී මතුවෙවී නිකං රැලි රැලි වගේ ගලාගෙන මතුවෙවී ඉදිරිපත් වෙනවා - එනවා. සමහර අවස්ථාවලදී

බණ අහනකොට ඒ ධර්ම කරුණු නිසා සිහිය හොඳට පිහිටන ස්වභාවයක් තිබෙනවා, වීර්ය මතුවෙවී එනවා. සමහර ධර්ම කරුණු අහනකොට සමාධි ගුණය ගොඩාක් එනවා. හරි නිස්කලංක ශාන්ත සෞම්‍ය මෘදු හිත් ඇතිවෙනවා. සමහර ධර්ම කරුණු අහත්දී සන්තෝශය - හිතේ ප්‍රභාශ්වර ගතිය ඒවාගේම තමයි හරි අවබෝධයක් - ධර්මය ගැන අවබෝධයක් - හිතීමක් - මෙනෙහි කිරීමක් - තේරුම් යාමක් වෙනවා. ඒනිසා සමහර ධර්ම කරුණු වලින් අධික වීර්යක් සමහර ඒවගෙන් ශ්‍රද්ධාවක් සමහර ඒවගෙන් සතුටක් සමහර ධර්ම කරුණුවලින් ප්‍රඥාව - සමාධිය වැඩෙනවා.

දැන් අපි මේ කථා කරන්නාවූ කොටස විශ්ෂයෙන්ම ශ්‍රද්ධාව වගේම ප්‍රඥාව දියුණු කරගන්ට හේතුවන ධර්ම අතපත ගැමක් මේ. මේ අපට ගැලපෙන ආකාරයට යොදල තිබෙන ධර්ම කරුණු තමයි අපි මේ කියල දෙන්නේ. දැන් මේ ඔක්කෝම ටික ගිහි ජීවිතයක් ගත කරන අය - මේ පින්වතුන්ට කිව්වට මේ ටික එකපාරම අහුවෙන්නේ නෑ හිතට. ඒක නිසා අහුවෙන ප්‍රමාණයට - අහුවෙන විදියකට - ගැටලුතැන් පොඩ්ඩක් නිරාකූල කරලා ඒවා ලිහල තියල මේ පින්වතුන්ගේ හිත්වලට මේක පොඩ්ඩක් වැක්කෙරෙන්ට - මේ පින්වතුන්ගේ හිත්වලට පොඩ්ඩක් මේක ලංවෙන්ට - මේ පින්වතුන්ගේ හිත්වලට මේක ටිකක් හොඳට දැනෙන්ට - පෙනෙන්ට - හරි ගස්සලා දෙන එක තමයි මේ දේශනාවකදී කෙරෙන්නේ. ඒක දේශක සහ ශ්‍රාවක දෙපක්ෂයටම ප්‍රඥාව ඇති කරගන්ට හේතුවෙනවා. ඒ නිසා, ඒ යන - ධර්මය අහන - හිතන - මෙනෙහි කරන - ධර්ම ගමන් මඟේ තවත් එක අවස්ථාවක් මේ. ඒ නිසා අද මේ ප්‍රඥාව දියුණු කරගන්ට - සමාධි ගුණය වඩා ගන්ට - වැඩෙන්ට -බුදුරජාණන්වහන්සේ කෙරෙහි - උන්වහන්සේගේ ඥානය - ප්‍රඥාව - කෙරෙහි හොඳ ප්‍රසාදයක් - පැහැදීමක් - ශ්‍රද්ධාවක් ඇතිවෙන්ට හේතුවන ධර්ම ගොඩේ - ඒවගේම මහා සංඝ රත්නය කෙරෙහි - සැරියුත් මහ රහතන් වහන්සේ කෙරෙහි අතිශය ගෞරවයක් - ශ්‍රද්ධාවක් උපදවාගන්ට හේතුවෙන ධර්මකරුණු වල මේ ටික අද අපි හිතමු - මෙනෙහි කරමු.

දැන් භාෂාවක් තියෙනවා - වාග් මාලාවක් තිබෙනවා - ඒවාගේම වචන භාවිතයක් තිබෙනවා ධර්මයක් දේශනා කරන කොට. ඒක බුදුරජාණන්වහන්සේත් අනුමත කරා. බුදුරජාණන්වහන්සේත් ඒ වචන භාවිතාවෙන් තමයි දේශනා කරේ. ඒක වචී විඤ්ඤතිය. උන්වහන්සේගේ සමහර අවස්ථාවල කාය විඤ්ඤතිය තිබුන. වචී විඤ්ඤතිය තියෙනවා. වචී විඤ්ඤතිය හරහා තමයි නිරුක්තිය එහෙම නැතිනම් භාෂාව උපකාර කරගෙන මේ කියන්නේ. මෙහි තිබෙනවා අද කථාකරන මාතෘකාව ‘සහජාත’ ධර්ම.

අදට ඔක්කෝම කියාගන්ට බැරිවෙයි. නමුත් අපි තරමක් ගමු. ‘සහජාත පච්චය’. මේ වචනය අපි දන්නවා - ප්‍රත්‍යය කියන එක. උපකාරක ධර්මයනේ. දැන් සහජාත කියල කියන්නේ ‘සහ + ජාත’ - ‘එකට උපන්’ ධර්මයන්ගේ උපකාරක ස්වභාවය. ‘සහ’ කියල කියන්නේ ‘සමග’ ‘එකට’. ඒකයි ඒකෙ තේරුම. තව ඕකට වචනයක් තිබෙනවා සමාන කමක් තිබෙන ‘සද්ධිං’කියල. ‘සද්ධිං’ කියල කියන්නේ ‘සමග’ ‘එකට’ කියන එකයි. අපි කියන්නේ ඔය ‘තිසරණේන සද්ධිං පංච සීලං ධම්මං යාචාමි’ කියල ‘තුන්සරණය සමග පංච සීල ධර්මය මම ඉල්ලා සිටිනවා’ කියල. ඔය ‘සද්ධිං’ වචනය. ඒකට සමාන වචනයක් තමයි ‘සහ’. දැන් ඕක සිංහල භාෂාවේත් පාවිච්චි කරනවා ‘සහ වරයා’ කියල. ‘සහවරයෝ’ කියල කියන්නේ එකට හැසිරෙන එකට ගමන් බිමන් යන්නාවූ අයට කියනවා ‘සහවරයෝ’ කියල. නිතරම එකට

ගැවසෙනවා. ඊළඟට කියනවා 'සහජාත' කියල 'සහජාත' කියන්නේ 'එකට හටගත්' 'එකට උපන්' 'එකට ඇතිවෙච්ච' 'එකට ඇතිවී කටයුතු කරන'. දැන් මේ ධර්ම වල 'සහ ජාත' එනම් එකට හටගන්න ධර්ම වල තිබෙන උදව් උපකාර පිළිබඳව - එකට රුංවු ගැසී උපදින ධර්ම වල තිබෙන - ඔවුනොවුන්ට ප්‍රත්‍යය වෙන ආකාරය තමයි මේකෙන් කියන්නේ.

ඒක පට්ඨාන උද්දේසයේ කියන්නේ මේ විදියටයි ඕක වාක්‍ය ගතකරලා තියෙන්නේ - දේශනා කර තියෙන්නේ - **'චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං සහජාතපච්චයෙන පච්චයො'** කියල එක වාක්‍යක් සඳහන් වෙනවා. ඕක මේ අපේ පින්වතුන්ට පට්ඨාන උද්දේසය ගැන සඣ්ඣායනා කරන කොට පෙනේවි දැනේවි.

**'චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං සහජාතපච්චයෙන පච්චයො'** මේකේ තේරුම - **'චත්තාරො ඛන්ධා අරූපිනො'** = 'අරූපී වූ ස්කන්ධ 4 ක්'

**'අඤ්ඤමඤ්ඤං'** = ඔව්නොවුන්ට

**'සහජාතපච්චයෙන පච්චයො'** = 'සහජාත භාවයෙන් උපකාර වෙනවා කියන එකයි'

අද මේ කථාව කියන කොට වචනයක් භාවිතා කරනවා **'චත්තාරො ඛන්ධා'** කියල. ඉස්සෙල්ල ඕක ඒ තරම්ම කියවුනේ නෑ. ඔය පංච ස්කන්ධ කථාව තමයි මේකේ කියවෙන්නේ. දැන් මේ චිත්ත චෛතසික රූප ධර්ම පිළිබඳව ගත්තම ස්කන්ධ වැටෙන්නේ එතනනේ. දැන් නිර්වාණ ධාතුව පංච ස්කන්ධයට අයිති නැනේ. එතකොට පංච ස්කන්ධය - උපාදාන ස්කන්ධය - ඔක්කොම සංඛ්‍යා ගත කරන්නේ සහ කොටස් කරන්නේ - බෙදාගන්නේ ඔය සිත් - චෛතසික ධර්ම වලින් සහ රූප වලින්.

දැන් මේ රූපය කියනඑක අරූපී එකක් නොවෙයි. රූපයක්නේ - රූප ධර්ම 28. දැන් මෙතන කථා කරන්නේ අරූපී ධර්ම. ඒක නිසා සිත් 89 න් ඊළඟට චෛතසික ධර්ම 52 න් ඔය කොටස් දෙකෙන් අපි අරූපී ධර්මස්කන්ධ හතරක් හඳනවා. කොටස් කර ගන්නවා. අවබෝධයට කොටස් කරගන්නවා. ඒකෙන් චෛතසික ධර්ම 52 ඇතුලේ තිබෙනවා 'වේදනාව' කියල චෛතසිකයක්. ඒ චෛතසිකය ගණන් ගන්නෙම 'වේදනා ස්කන්ධයටයි'. ඕක හැමතැනම හැසිරෙනවා. ඒක නිසා වේදනා ස්කන්ධයයි. තව චෛතසික ධර්ම 51 ක් තියෙනවා. ඒකෙන් 'සංඥා' චෛතසික 'සංඥා ස්කන්ධය' හැටියට සඳහන් කරනවා. තව තියෙනවා චෛතසික ධර්ම 50 ක්. ඒ 50 ම සංස්කාර ස්කන්ධය හැටියට සලකනවා. එතකොට චෛතසික ධර්ම 52 න් (අරූපී ධර්මනෙ මේවා) - ස්කන්ධ තුනක් සකස් වෙනවා - තුනක් තියෙන බවට අපි අවබෝධ කරගන්නවා - තේරුම් කරගන්නවා. ඒ තමයි චෛතසික 52 න් තමයි වේදනා ස්කන්ධය අහුවෙන්නේ. ඒකෙන් තමයි සංඥා ස්කන්ධය අහුවෙන්නේ. ඒ ගොඩෙන් තමයි සංස්කාර ස්කන්ධය අහුවෙන්නේ.

එතකොට මේවා අරූපී ධර්ම ගොඩවල් තුනක්. 'වේදනාව' 'වේදනා ස්කන්ධයයි' අරූපියි - 'සංඥාව' 'සංඥා ස්කන්ධයයි' අරූපියි - අනිත් චෛතසික ධර්ම 50 'සංස්කාර සකන්ධයයි'

ඒවත් අරූපියි. එතකොට අරූපී වූ - රූප නොවන - රූප ගතියක් නැති අරූපී වූ ධර්ම ගොඩවල් ස්කන්ධ ගොඩවල් තුනක් තිබෙනවා මෙතන.

ඊළඟට විඤ්ඤාණ සකන්ධය ගත්තම ඒ විඤ්ඤාණ සකන්ධයේ 'හිත' – (හිත් 81 කක් සලකන්නේ) ඒ හිත 81 කම සලකනවා විඤ්ඤාණ ගොඩ - විඤ්ඤාණ රාශිය - විඤ්ඤාණ සමූහය - විඤ්ඤාණ ස්කන්ධය වශයෙන්. දැන් මේ කියන්නාවූ ධර්ම - හිතත් ඇවිල්ල අරූපීනෙ - දැන් මේ - මෙතන කියපු කථාවේ තියෙනවා - මේ පින්වතුන්ට තේරෙනවා **'චත්තාරො ඛන්ධා අරූපිනො'** කියල කියන්නේ 'වේදනාවයි' 'සංඥාවයි' 'චෛතසික ධර්ම 50 නම්වූ සංස්කාර ස්කන්ධයයි' 'හිත් ටිකයි'. මේවා ස්කන්ධ 4 ක්.

මේ ස්කන්ධ 4 - **'අඤ්ඤමඤ්ඤං'** = 'ඔවුනොවුන්ට' එනම් වේදනාව සංඥාවට - සංඥාව වේදනාවට සහ හිතට - සංස්කාරයෝ අනිත් ධර්ම තුනට - ඔවුනොවුන්ට උපකාර කර ගන්නවා. මේක හිතිය යුතු දෙයක්. හොඳට මෙනෙහි කල යුතු දෙයක්. දැන් බලන්ට - අපි මේක මීට ඉස්සෙල්ලත් කියල තියෙනවා.

මේසයක් හැටියට සැලකෙන්නේ කකුල් හතරක් තියෙන - ලෑල්ලක් ගහල තියෙන එක්තරා ලීයකින් හදපු වස්තුවක්. මේ වස්තුවේ කකුල් හතරක් තියෙනවා. මේ කකුල් හතරේ තිබෙනවා විශේෂ වැඩ කටයුත්තක් තිබෙනවා - ඒවගේම තමයි එකම වෙලාවේ මෙයාගේ එක පාදයකින් වැඩ කටයුතු දෙකක් සිද්ධ වෙනවා. මේක උදාහරණයක් වශයෙන් මේසය ගැන කියන්නේ. එක මේස කකුලකට බෑ අර මේසය දරාගෙන ඉන්ට. මේස ලෑල්ල දරාගෙන ඉන්ට බෑ. ඒ නිසා තව මේස කකුල් තුනක් ඒකට උදව්වට ඉන්නවා. දැන් මේ එක මේස කකුලක් දරන්නේ එක්තරා බර ප්‍රමාණයක් පමණයි. අනිත් මේස කකුල දරන්නෙත් තවත් බර ප්‍රමාණයක් පමණයි. ඒ ඒ මේස කකුල් එක්තරා බර ප්‍රමාණයක් දරනවා. එතකොට එක මේස කකුලක් අනිත් මේස කකුල් තුනට වැටෙන්නාවූ බර අඩුකරලා ඒ අයට උදව්වක් වෙනවා. ඒ තුන්දෙනාටම දැන් අපි හිතමු එක මේස කකුලක් අයින් වෙච්ච ගමන්ම ඒ අයින් වෙච්ච මේස කකුලේ බර අනිත් තුන් දෙනාට බෙදෙනවනේ - ඒවගේ. එක මේස කකුලක් අනිත් තුන් දෙනාගෙන් ලැබෙන්නාවූ උපකාරය ලබනවා. ඒ කියන්නේ දැන් තනි මේස කකුලකට වැටෙන්න තියෙන බර අනිත් මේස කකුල් තුන දරාගෙන ඉන්න නිසා මෙයාට සැහැල්ලුවක්. ඒ සැහැල්ලුව ලබනවා මෙයා. ලබන ගමන්ම අනිත් තුන් දෙනාට යම්කිසි බරක් වැටෙන්ට තිබෙනවා නම් ඒක මෙයා අඩු කරලා දෙනවා. එකම වෙලාවේ අනිත් මේස කකුල් තුනටම උපකාර වෙනවා සැහැල්ලු කරලා දීම වශයෙන්. ඒවගේම තමයි ඒ වෙලාවේම තමන් අනිත් අයගෙන් උදව්වක් ලබනවා, ඒ අයත් තමන්ට ඔක්කෝම බර දෙන්නේ නැතුව දරාගෙන ඉන්නවා. මේ සිද්ධිය එක වෙලාවේ සිද්ධ වෙන්නේ. මේ මේස කකුල් හතරම කරන්නේ එක වැඩයි. මේසය දරාගෙන ඉදීම. ඒක නිසා මේක සහජාත ධර්ම. උදව්වක් උපකාරයක් හැටියට මේක තේරුම් ගන්න. මේක සහජාත ධර්ම ස්වභාවයක්.

අපි ඕක මනුස්සයන්ට දාල ගත්තොත් මේසයක් වගේ ලෑල්ලක් හතරදෙනෙක් උස්සගෙන ඉන්නවා. හතර දෙනෙක් එකතුවෙලා මෙසේ ලෑල්ලක් උස්සගෙන ඉන්නවා. සමව උස්සගන ඉන්නේ. අපි හිතමු ඇරගෙන යනව කියල. මේ ඇරගෙන යනකොට ඒ හතරදෙනා ඔවුනොවුන්ට - එක මනුස්සයෙක් අනිත් තුන්දෙනාට උදව් වෙනවා. දෙවෙනි මනුස්සයා -

තුන්වෙනි මනුස්සයා සහ හතරවෙනි මනුස්සයා මෙයාගේ උදව්ව ලබනවා. දෙවෙනි මනුස්සයා මොකද කරන්නේ පළවෙනි එක්කෙනාටයි - තුන්වෙනි එක්කෙනාටයි - හතරවෙනි එක්කෙනාටයි උදව් කරනවා. එයත් බරක් දරා ගන්නවා. ඒවගේම අනිත් අයගේ උදව්වත් ලබනවා. මෙන්න මේ විදියට සහජාත ධර්මයෝ ඔවුනොවුන්ට - එකිනෙකාට උදව් කරනවා - උදව් ලබනවා. ඒක නිසා කියනවා 'සහජාත' - උදව් කිරීම් වශයෙන් එකට ඉපදිලා ඔවුනොවුනට උදව්කිරීම් වශයෙන් උපකාර වෙනවා කියල. ඒක නිසා මේ ස්කන්ධ වචනය අරගෙන තමයි මේක කියන්නේ. **'චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං සහජාතපච්චයෙන පච්චයො'** -
ඔය එකක්. ඕක වෙනමම රූප නැති අරූප ධර්ම සම්බන්ධයෙන් තමයි කියන්නේ.

දැන් තව වාක්‍යක් තිබෙනවා.

**'චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං සහජාතපච්චයෙන පච්චයො'** - හරියට පරෙස්සම් වෙන්න මේ කථාව - ඉස්සර වෙලා කිව්වේ කොච්චරක්ද ? ඉස්සර වෙලා කිව්වේ සිත් ටිකයි - චෛතසික ධර්ම ටිකයි වෙනම අරගෙන. ඒක එහෙම කිව්වයින් පස්සේ තමයි මේක තේරෙන්නේ. අරූපී ධර්ම පිළිබඳව ඉස්සෙල්ල කිව්වා. දැන් කියනවා **'චත්තාරො මහාභූතා'** – **'චත්තාරො මහාභූතා'** කියල කියන්නේ පඨවි අපෝ තේජෝ වායෝ කියන සතර මහා භූත ධර්මයෝ. මේ රූප ගොඩේ තිබෙනවා රූප ධර්ම 28 ක්. ඒ 28 න් 24 පැත්තකට තියලා 4 දෙනෙක් විතරක් කියනවා. **'චත්තාරො මහාභූතා'** - පඨවි ධාතුව - ආපෝ තේජෝ වායෝ ධාතු - ඔවුනොවුන්ට - **'අඤ්ඤමඤ්ඤං'** = ඔවුනොවුන්ට, එකට හටගෙන එකට ඉපදීම් වශයෙන් උදව් වෙනවා කියල. කවදාකවත්ම මේ පඨවි ධාතුවට තනියම හුදකලාව පහළ වෙන්න බෑ. ආපෝ ධාතුවට අනිත් තුන්දෙනාගේ සහය උපකාරය නැතුව එකට හටගන්න බෑ. තේජෝ ධාතුවටත් ඒවගේ. වායෝ ධාතුවටත් ඒ වගේ. මේ හතර ධාතූන් ඔවුනොවුන්ට උදව් වෙන - උපකාර වෙන - උපකාර කරගන්න ගතියක් තියෙනවා. හැබැයි මේ මහා භූත ධර්මයෝ විතරයි මෙතන කියන්නේ. ඒකත් හොඳට අපේ පින්වතුන් මේ මාතෘකාව යටතේ කථා කරනකොට හිතේ දරා ගන්න. ඉස්සෙල්ලාම නාම ධර්ම 4 ක් කිව්වා. දැන් රූප ධර්ම 4 ක් කිව්වා රූප 28 න්. ඒකට හේතු තියෙනවා. තව විස්තර විභාග අපිට ගොඩක් ඉස්සරහට කථා කරන්න තියෙනවා. මේක මේ පට්ඨාන ධර්මයේ ඉස්සරවෙලාම හිතට හැඩගැස්සීගෙන පෙළ ගැස්සීගෙන යන්න එපාය.

තව එකක් තියෙනවා මෙහෙම - **'ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං සහජාතපච්චයෙන පච්චයො'** - එතන භාෂාව පාවිච්චි කරලා තියෙන විදිය හරි පරෙස්සමෙන් තේරුම්ගන්ට. **'ඔක්කන්තික්ඛණෙ'** – **'ඔක්කන්ති ඛණෙ'** කියල කියන්නේ උපදින වෙලාව නැත්නම් ප්‍රතිසන්ධිය ඇතිවන වෙලාවේ. එතැනදී සිද්ධියක් සිද්ද වෙනවා - **'නාමරූපං'** - එතනදී කියනවා නාම ධර්මයි රූප ධර්මයි දෙගොල්ලම - **'අඤ්ඤමඤ්ඤං සහජාතපච්චයෙන පච්චයො'**- ඔවුනොවුන්ට උදව් වෙනවා උපකාර වෙනවා. ඉස්සර වෙලා කියාගෙන ගිය කථාව හරී පරෙස්සමින් තේරුම් ගන්න. **'චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං'** කියන තැන වෙලාවක් කිව්වේ නෑ - මැරෙන වේලාවෙද - උපදින වේලාවෙද - ඉන්න වෙලාවද - ඔය කථා කිව්වේ නෑ. සවභාවයෙන් generally සිද්ධ වෙන දෙයක්

කියන්නේ. **'චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං'** - 'සතර මහා භූතයෝ ඔවුනොවුන්ට' - එතනදීත් ඒ අයගේ තිබෙන්නාවූ සවභාව ධර්මය කියන්නේ. ඒක කාලයක් වේලාවක් කියන්නේ නැතුව පොදුවේ කියනවා. ඊට පස්සේ **'ඔක්කන්තික්ඛණෙ'** කියල වෙනම තැනක් කියනවා - ඒ කියන්නේ විශේෂිත තැනක්. ඒ තමයි ප්‍රතිසන්ධිය ඇතිවෙන තැන. ප්‍රතිසන්ධි අවස්ථාවේදී හිත විතරක් නෙමෙයි ප්‍රතිසන්ධි ගන්නේ. ඊළඟට රූප විතරක් නෙමෙයි ප්‍රතිසන්ධි ගන්නේ. මෙතැන නාම රූප ධර්මයෝ දෙගොල්ලම උපදිනවා. මේ කථාව කියන කොට මේ පින්වතුන්ට වැටහී යන්න ඕන - හිතට දැනී යන්ට ඕන - පෙනී යන්න ඕන මොනවගේ භවයක් ගැනද මේ කථා කරන්නේ කියල. මේ කථා කරන්නේ අරූප ලෝකෙත් නෙමෙයි - මේ කථා කරන්නේ අසංඥතලය කියන්නාවූ රූප පමණක් තියන තැනකුත් නෙමෙයි. මේ කථාකරන්නේ නාම රූප ධර්ම දෙකම තිබෙන්නාවූ - රූපයෙකුයි නාමයයි දෙකම තිබෙන්නාවූ පංචවෝකාර භවය ගැන තමයි මේ කථා කරන්නේ - **'ඔක්කන්තික්ඛණෙ නාමරූපං'** නෙ. **'සහජාතපච්චයෙන පච්චයො'** = ඉපදීම් වශයෙන් ඔවුනොවුන්ට උදව් වෙනවා - උපකාර වෙනවා.

ඊළඟට තියෙනවා **'චිත්තචෙතසිකා ධම්මා'** = 'චිත්ත චෛතසික ධර්මයෝ'

**'චිත්තසමුට්ඨානානං රූපානං සහජාතපච්චයෙන පච්චයො'**

ඉස්සෙල්ල කිව්වා ස්කන්ධ වශයෙන් - ඊට පස්සේ ප්‍රධාන මහා භූත ධර්ම වශයෙන් - ඊට පස්සේ අවස්ථා වශයෙන් - ඊට පස්සේ චිත්ත චෛතසික ධර්ම වශයෙන් - කියනවා තව රූප කොටසක් ගැන. චිත්ත සමුට්ඨාන රූප කියල ජාතියක් තිබෙනවා.

දැන් මේ ටික අපි ඉස්සෙල්ල තේරුම් ගනිමු. අපි මේක ටික තේරුම් ගැනීමට අපි යමු, කුසල - අකුසල - අව්‍යාකෘත කියල ධර්ම කාණ්ඩයක් කිව්වනේ අපි. කුසලා ධම්මා - අකුසලා ධම්මා - අබ්‍යාකතා ධම්මා කියල. ඒ කුසල ධර්ම - අකුසල ධර්ම -අබ්‍යාකතා ධර්ම ගොඩේ අපි ඉස්සෙල්ලාම බලමු උදාහරණයක් හැටියට චෛතසික අඩුවෙන් තිබෙන්නාවූ ලෝභ සහගත සිතක්. මේ ලෝභ සහගත සිතක තියෙන ධර්ම ටික අපි බලමු.

පළවෙනි ලෝභ සහගත සිත අපේ මේ පින්වතුන් අහන නිසා මේවා නිතර කියවන නිසා සාකච්ඡා කරන නිසා මේ ධර්ම ගොනු කරගන්න පහසුයි පුළුවන්.

පළවෙනි ලෝභ සහගත සිත කොහොමද කියවෙන්නේ -

**'සෝමනස්ස සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික සිත'**නෙ. සෝමනස්ස සහගතයි, දිට්ඨිගත සම්ප්‍රයුක්තයි, අසංඛාරිකයි. දැන් මේකේ තිබෙනවා ධර්ම මෙපමණක්. මේක අකුසල් සිතක්. මේ අකුසල් සිතේ ලෝභය ප්‍රධානය කරගෙන ධර්ම ටිකක් තිබෙනවා. දැන් හිත තියෙනවානෙ - ඒ හිත 'එකක්' නෙ. ඒක නාම ධර්මයක්නේ - ඒක අරූපී එකක්නේ.

සර්ව චිත්ත සාධාරණ චෛතසික ධර්ම තිබෙනවා - ඵස්ස - වේදනා - සංඥා - චේතනා - ඒකග්‍රතා - ජීවිතේන්ද්‍රිය - මනසිකාරය = 7 + විතක්ක - විචාර - අධිමොක්ඛ - විරිය - ප්‍රීති -

ඡන්ද (ප්‍රකීර්ණක 6 ) = සියල්ල 13 + මෝහ - අහිරික - අනොත්තප්ප - උද්ධච්ච (අකුසල සාධාරණ චෛතසික ධර්ම 4 ) = 17 + ලෝභ චෛතසිකය = 18 + දිට්ඨි චෛතසිකය (1) = 19

මේ චෛතසික ධර්ම 19 ය අර පළවෙනි අකුසල ලෝභ සිතේ වැඩ කරනවා. එතකොට චෛතසික 19 යකුත් ඊළඟට සිතකුත් යන මේ ටික අකුසල ධර්මනෙ. මේ අකුසල ධර්ම ඔක්කොම ටික නාම ධර්මනෙ. බලන්ට සහජාත ධර්ම - කවදාවත්ම මේ සිතට - අකුසල් සිතක් හැටියට ලෝභ අරමුණකට යන්න මේ ස්පර්ශය නැතුව බෑ - වේදනාව නැතුව බෑ - සංඥාව නැතුව බෑ - ජීවිතේන්ද්‍රිය නැතුව බෑ - විතක්කය නැතුව බෑ - විචාරය නැතුව බෑ - තණ්හාවට කවදාකවත්ම අනිත් චෛතසික ධර්ම 18 දෙනාගේ උදව් නැතුව - ඒ හිතේ උදව්ව නැතුව කවදාකවත්ම අරමුණකට ඇලී බැඳී තණ්හාවෙන් යන්න බෑ. ඊළඟට සප්ර්ශය කියන එකට කවදාකවත්ම අනිත් චෛතසික ධර්ම 18 යි - හිතයි නැතුව ක්‍රියාත්මක වෙන්ට බෑ. ස්පර්ශයේ තියෙන්නේ ධර්මයක් ධර්මයක් සමග සම්බන්ධ කරන ගතියයි. ඉතින් තමන්ම ගිහිල්ලා ස්පර්ශවෙන්න බැනේ. ඒක ඇවිල්ලා කෘත්‍යක්නේ. ඒක නිසා ස්පර්ශයට වැඩක් නෑ තනියෙන් ඇවිල්ල. අනිවාර්යෙන්ම මේ කියන්නාවූ චෛතසික ධර්ම 19 යයි 'සිතයි' කියන මේ ධර්ම 20 ස්සේ ගොනුව එකට හරියට balance වෙලා - ශක්ති සම්පන්න වෙලා - මිත්‍ර වෙලා - සම වෙලා තමයි අර අරමුණට යන්නේ. කිසිම කෙනෙකුට තනියෙන් යන්න බෑ. ඒ නිසා කියනවා මේ ධර්ම - අකුසල් සිත් - මේවා ඇවිල්ල 'සත්වයෝ' 'පුද්ගලයෝ' 'ජීව' 'ආත්ම' 'කෙනෙක්' නෙමෙයි. ඒවා ඇවිල්ල එක්තරා විශ්වයේ තිබෙන ශක්ති විශේෂයෝ. ධර්ම විශේෂයෝ. සත්ව පුද්ගල නොවන ධර්ම විශේෂයෝ. ඒවගේම නාම ගුණ විශේෂ. ඒවගේම නාම ධර්ම හැටියට ක්‍රියාත්මක වෙන ක්‍රියා විශේෂ. මේ 'ක්‍රියාධර්ම' ටික 'නාමධර්ම' ටික ඔවුනොවුන්ට උදව් වෙවී උපකාර වෙවී අරමුණක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙනවා. ඒක නිසා ඒවා සහජාත ධර්මයෝ. සහජාත ධර්ම පොකුරක් මේ. **'අඤ්ඤමඤ්ඤං'** කියල කියන්නේ - එතන ඔවුනොවුන් - ඔවුනොවුන්ට උපකාර කර ගන්නවා. මෙතන තියෙනවා ස්කන්ධ හතරක්. මේ චිත්ත - චෛතසික යන ධර්ම 20 ලඟ ස්කන්ධ 4 ක් තිබෙනවා. ඒ තමයි අර 'වේදනා චෛතසික' තියෙනවනේ. ඒ 'වේදනා චෛතසික' 'වේදනා ස්කන්ධයයි'. එතකොට චෛතසික 19 න් එකක් අඩු උනා. තව තියෙනවා 18ක්. 'සංඥා චෛතසිකය' සංඥා ස්කන්ධය හැටියට වෙන් වෙනවා. තව තියෙනවා චෛතසික 17 ක්. ඒ අකුසල් සිතේ වේදනා චෛතසිකය 'වේදනා ස්කන්ධයයි'. 'සංඥා චෛතසිකය' 'සංඥා ස්කන්ධයයි'. ඉතිරි චෛතසික 17 'සංස්කාර ස්කන්ධ'යයි. ඒ 'අකුසල් සිත' 'විඤ්ඤාණ ස්කන්ධ'යයි. මෙතන තිබෙනවා තනි ධර්ම වශයෙන් ගත්තට පස්සෙ ධර්ම 20 ක් තියෙනවා. තනි කර ගත්තයින් පස්සේ - සමාන ගතියක් නැති - වෙන වෙනම සවභාව ඇති - ධර්ම තිබෙනවා 20ක්. ඒ 20 අරූපී ධර්ම 'ස්කන්ධ' හැටියට කොටස් කරායින් පස්සේ කොටස් හතරක් තියෙනවා. ඒක නිසා ස්කන්ධ හතරක් තිබෙනවා මෙතන. නාම ධර්ම ස්කන්ධ හතරක්.

මේවා ඔවුනොවුන්ට පක්ෂපාතීව - ඔවුනොවුන්ට හිතවත්ව සහ **'අඤ්ඤමඤ්ඤං'** = අන්නෝන්‍ය වශයෙන් - **'සහජාතපච්චයෙන පච්චයො'** = ඔවුනොවුන්ට උදව් කරගන්නවා.

ඔය පළවෙනි අකුසල් සිතේ සහජාත ධර්ම ප්‍රත්‍යය වන ආකාරය ඔය කිව්වේ. කවදාකවත් එකක්වත් නැතුව යන්න බෑ. අනිත් එක තමයි සමහර වෙලාවට වීර්ය අඩු කමක් හෝ වැඩි කමක් හෝ වෙලා එකක් පොඩ්ඩක් එහෙට මෙහෙට වෙලා එනවා දෙවෙනි සිතේ. ඔය අකුසල් සිත.

අපි හිතමු මෙහෙම. තව කුසල සිතක් ගැන අපි හිතමු මෙහෙම. කෙනෙක් දානමය පිං කමක් සිදු කරනවා. දානමය පිංකමක් සිද්ද කරන වෙලාවේ එයාට තියෙනවා අලෝභී දාන චේතනාව. අලෝභී සිතක් පහළ වෙනවා. ඇත්ත වශයෙන්ම දානය සිද්ධ වෙන්නේ ඇහේ නෙමෙයි හිතේ. ඒ දානේ හැටියට සලකන හිතේ ධර්ම ටික අපි ඉස්සෙල්ල බලමු. කොච්චරක් තියෙනවද කියල. දැන් අපි උදාහරණයක් හැටියට අකුසල් පක්ෂයෙන් ගත්ත ලෝභ හිත. අපි කුසල් පක්ෂයෙන් මේ විදියට ගනිමු. කෙනෙක් දානමය පිංකමක් සිද්ධ කරනවා. ඒ දානමය පිංකම සිද්ධ කරන වෙලාවේදී **'සෝමනස්ස සහගත ඤාන සම්ප්‍රයුක්ත අසංකාරික කුසල් සිත'** පහළ වෙනවා. දැන් දානයක් දෙන වෙලාවේ - ඒ කුසල් සිතේ තියෙනවා නාම ධර්ම. මේ නාම ධර්ම වලින් තමයි මේ දානය වෙන්නේ. එතැන තිබෙනවා

සර්ව චිත්ත සාධාරණ චෛතසික **7** යි **+** ප්‍රකීර්ණක චෛතසික **6 = 13**

**13 +** කුසල සාධාරණ චෛතසික ධර්ම **19** (ශ්‍රද්ධා - සති - හිරි - ඔත්තප්ප- අලෝභ - අදෝස - තත්‍රමජ්ඣත්තතා - කාය පස්සද්ධි - චිත්ත පස්සද්ධි - කාය ලහුතා - චිත්ත ලහුතා - කාය මුදුතා - චිත්ත මුදුතා - කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා - කායපාගුඤ්ඤතා - චිත්තපාගුඤ්ඤතා -කායජ්ජුකතා -චිත්තුජ්ජ කථා **= 32 +** ප්‍රඥාව(1) (ඤාන සම්ප්‍රයුක්තව දානේ දෙන නිසා) **= 33** මේ චෛතසික ධර්ම ටිකට හිත නැතුව ඉන්න බෑ. දැන් මොන එක්කෙනා උනත් මේ චිත්ත ගති ටික හැම වෙලාවේම ඉන්ට ඕනේ වෙන්නේ - ක්‍රියාත්මක වෙන්ට ඕනෑ - උපදින්ට ඕනෑ - පහළ වෙන්ට ඕනෑ ඒ තමයි හිත ප්‍රධාන කරගෙන. මේවා තනියෙන් එන්නේ නෑ. එතකොට තව ධර්මයක් එන්ට ඕනෑ. ඒ තමයි **'හිත'**. එතකොට නාම ධර්ම තියෙනවා **34** ක්. චෛතසික ධර්ම **33** යි **'හිතයි'** ඔක්කොම නාම ධර්ම **34**යි. මෙතැන අරූපී ධර්ම **34** ක් තියෙන්නේ. ඒ අරූපී ධර්ම **34** - **'චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං'** - ස්කන්ධ 4 ක් වෙනවා මෙතන. කොහොමද? ඉස්සෙල්ල කිව්වේ අකුසල සකන්ධ - දැන් මෙතැන් කියන්නේ කුසල ස්කන්ධ. වේදනා චෛතසිකය සංඥා චෛතසිකය යන දෙක යනව 'වේදනා ස්කන්ධය' යයි 'සංඥා ස්කන්ධයයි' හැටියට. ඉතිරි චෛතසික ධර්ම **31** යනවා 'සංස්කාර ස්කන්ධයට'. ඒ 'කුසල් සිත' 'විඤ්ඤාණ ස්කන්ධය' වෙනවා. මේ කියන්නාවූ ධර්ම 34 ම එකිනෙකාට - එකිනෙකාට - එකිනෙකාට උදව් වෙනවා උපකාර වෙනවා - හැබැයි එක ධර්මයක්වත් තමන්ගේ ලක්ෂණය ගිහිල්ලා ඇහේ ගස්සවන්නේ නෑ. කිසිම ධර්මයක් අනිත් එක්කෙනාගේ ගතියක් ගුණයක් තමන්ගේ ඇහේ ගාව ගන්නෙත් නෑ. තමන් වෙනම ලක්ෂණයකින් වෙනම ගුණයකින් පෙනී ඉන්න ගමන් අනිත් ධර්මයට උදව් වෙන උපකාර වෙන ස්වභාවය තමයි මේකේ තියෙන්නේ. දැන් මෙතැන තිබෙනවා **'අඤ්ඤමඤ්ඤං'** එනම් ඔවුනොවුන්ට උදව් වෙනවා උපකාර වෙනවා - මේ කුසල් සිතක.

දැන් අපි තව එකක් ගත්තම ඔය විදියට සෑම සිතකම ඒ ප්‍රමාණයට  උදව් කරනවා උදව් ලබනවා.

තව එකක් තිබෙනවා - ඒක ටිකක් ගරු ගාම්භීරයි. සතර ස්කන්ධයෝ - මහා භූත හතර ඔවුනොවුන්ට උදව් උපකාර කර ගන්නවා. ඒක අර කියපු අනුසාරයෙන් තේරුම් ගන්ට පුළුවන්. හැබැයි තව එකක් තියෙනවා විශේෂයෙන්ම **'ඔක්කන්තික්ඛණෙ'** එනම් උපදින අවස්ථාවේදී - මවු කුසක පිළිසිඳ ගන්න අවස්ථාවේදී 'නාම ධර්මයෝ' 'රූප ධර්මයෝ' ඔවුනොවුන්ට උදව්  කර ගන්නවා. මේක ටිකක් අපි පරෙස්සමින් තේරුම් ගන්ට ඕන. දැන් මව් කුසට ඉපදෙන්ට පිළිසිඳගන්ට  එන ඒ විඤ්ඤාණය ඉස්සෙල්ල ජීවිතයක චුතියෙන් පස්සේ ප්‍රතිසන්ධියක් හදාගන්න තැනදී - රූප ලෝකයෙන් අයින් වෙලා එන (අපි හිතමු මනුස්ස ලෝකයෙන් අයින්වෙලා මනුස්ස ලෝකයේම කෙනෙක් උපදිනවා කියල) ඒ වෙලාවේදී එයා මනුස්සලෝකේ ඉස්සෙල්ල හිටිය රූපයකුත් එක්ක නාම ධර්ම 4 ක් එක්කාසු කරගෙන. ඒ පහම අයින් කරලා එනවා - ඒ එන කොට අලුත් තැනදී එයා ඒ ලෝකයෙන් කිසිම දෙයක් අරගෙන එන්නේ නෑ. නමුත් මෙතනට එනකොට නාම ධර්ම 4  එනම් වේදනාව - සංඥාව - සංස්කාර - විඤ්ඤාණය සහ එහි ඇති අනෙකුත් චෛතසික ධර්ම  (මෙහිදී විඤ්ඤාණය ප්‍රධානයි) යන මේ නාම ධර්ම 4 ට පිහිටා සිටින්ට එක පාරම ඒකෙ ආනුභාවයෙන්ම ඒ ක්‍ෂණයෙහිම හැදෙනවා රූපයක්. අපි හිතමු - මෙහෙම  උදාහරණයක් හැටියට ගත්තොත් එහෙම එතන තිබෙනවා හෘදය වස්තු රූපය. හෘදය වස්තු රූපයේ ඒ රූපය තමයි මේ නාම ධර්මයන්ට හරියට ඉන්න හිටින්ට තියෙන තැන. හරියට කියනවානම් තැටියක් රත් උනායින් පස්සේ තියෙනවනේ රස්නයක්. ඒ රස්නය ඇතිවෙනකොට තිබෙනවා අමුතු චලන ගතියක් - උණුහුම් ගතියක් තිබෙනවා මිරිඟුව වගේ. අන්න ඒ වගේ හිතට රූපයක් නැතුව ඉන්න බැනේ පංචවෝකාර භවයේදී - ආන්න ඒ අවස්ථාවේදී හෘදය වස්තු රූපය එහෙම නැත්නම් වස්තු රූපය උදව් වෙනවා අර නාම ධර්ම 4 ට - නාම ධර්ම 4 උදව් වෙනවා අර වස්තු රූපයට. ඔන්න ඔය නිසා නාම රූප ධර්මයෝ ඔවුනොවුන්ට සහජාත භාවයෙන් එකතුවීම් වශයෙන් උදව් වෙනවා උපකාරවෙනවා කියල කියනවා. දැන් මේ විදියට බැලුවට පස්සේ ගොඩාක් තිබෙනවා - ඔය ප්‍රතිසන්ධි හිත ගැන කියන කොට ඒක කුසලත් නෙමෙයි ඒක අකුසලත් නෙමෙයි ප්‍රතිසන්ධි සිත විපාක සිතක් නිසා ඒක අව්‍යාකෘතයි. ඒක නිසා ඉස්සෙල්ල කුසල ධර්ම වල ස්කන්ධ ගණන් ගැනීම - අකුසල ධර්ම වල ස්කන්ධ ගණන් ගැනීම - මෙතන අව්‍යාකෘත ධර්ම වල ස්කන්ධ ගණන් ගැනීම. ඒ හැම එකකම ඔවුනොවුන්ට උදව් වෙන උපකාර වෙන ස්වභාවය තමයි කියන්නේ.

**'චිත්තචෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං සහජාතපච්චයෙන පච්චයො'** - අනිත් එක තමයි මේ අපේ හිතක් පහළ වෙනකොටම මහා පුදුම සිද්ධියක් වෙනවා. අපි දන්නේ නැතුවම ඒ හිතේ අනුභාවයෙන් හිතේ ශක්තියෙන් පහළ වෙනවා චිත්ත සමුට්ඨානික රූප. ඒවත් එකට උපදින්නේ. ඉස්සෙල්ල සිත් පහළවෙලා පස්සේ නිකං සමුට්ඨාන රූප පහළ වීමක් නෑ. එකටම තමයි පහළ වෙන්නේ. ඒක නිසා කියනවා චිත්ත චෛතසිකයන් නිසා රූප ධර්මයෝ ඔවුනොවුන්ට උපකාර වෙවී පහළ වෙනවා කියල. දැන් මේක අපි  හිතමු මෙහෙම. අපි හිතමු අපි භාවනා කරනවයි කියල. ඉඳගෙන භාවනා කරනවා. භාවනා කරන කොට අපි හිත දිහා බලාගෙන ඉන්නකොට ඔය පහළ වෙන - මෙනෙහි කරන හිතටත්

අනුරූපව ජීවිතයේ චිත්තජ රූප පහළ වෙනවා. සිත් වෙනස් උනානම් අමුතු සිතක් පහළ උනානම් ඒ අමුතු සිත පහළ වෙනකොටම කෙලෙස් හෝ නිකෙලෙස් ඒ එක්කම ඒ පහළ වෙච්ච සිතට ගැලපෙන්ට අමුතුම රූපයම පරිසරයක් අපේ ඇඟේ හැදෙනවා. ඒක අපිට දැනෙනවා. ඒ ඇතිවන්නේ චිත්තජ රූපයෝ. ඔය විදියට ගොඩක් එක එක - එක එක - සිතක් සිතක් - සිතක් සිතක් පාසා මේ චිත්තජ රූප පහළ වෙනවා. ඒවා ඔවුනොවුන්ට උදව් වෙනවා උපකාර වෙනවා. දැන් මේ විදියට බලාගෙන ගියහම මේ සහජාත ධර්මයෝ ඔවුනොවුන්ට පහළ වෙන්ට උපකාර වෙන ආකාරය කුසල් වශයෙනුත් අකුසල් වශයෙනුත් අව්‍යාකෘත හැටියටත් අපිට තේරුම් ගන්ට - හිතාගන්ට පුළුවන් හොඳට තව තව මෙනෙහි කරන්ට සැමදෙනාටම ශක්තිය ලැබේවා! කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. අදට මේ පින්වතුන්ට සාකච්ඡා වාරයට පොඩ්ඩක් අවස්ථාව තියල අපි මෙතකින් මේ කෙටි දේශනාව හමාර කරනවා. ඒවගේම ප්‍රශ්න කීපයක් විතරක් අපි අහමු. මේ පිංවත් සැම දෙනාටම ගොඩාක් ප්‍රශ්න ඇති. සමහර අයට නැතුව ඇති. නමුත් මේක තව ඉස්සරහට සාකච්ඡා කරන්ට ඕන - කථා කරන්ට ඕන. මීට ඉස්සෙල්ලත් කියල තියෙන නිසා මම හිතන්නේ මේක අමාරුවක් වෙනේකක් නැතෙයි කියලත් මගේ විශ්වාසයක් තිබෙනවා. කෙසේ හෝ ධර්ම කාරණය නිවැරදිව තේරුම් ගැනීම වටිනවා. මොනවා හරි තියෙනවනම් අහන්න. ඒවගේම මේ වෙලාවට ගන්ට සුදුසු එකක් තිබුනොත් අපි ගමු අනිත් ඒවා ඉස්සරහ අවස්ථාවකදී අපි සාකච්ඡාවට ගනිමු. සැමදෙනාටම තෙරුවන් සරණයි! ධර්ම අවබෝධය නිර්වාණ අවබෝධය සුවසේම සිද්ධ වේවා කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා.

සාධූ! සාධූ! සාධූ!

<u>ප්‍රශ්නය</u> - සවාමීන්වහන්ස අර 'චත්තාරො ඛන්ධා' කියපු තැන විඤ්ඤාණ ස්කන්ධය ගත්තු තැන ස්වාමීන්වහන්ස අපි සිත් 81 පමණයි ගත්තේ, එතනදී අපිට තේරෙනවා ලෝකෝත්තර සිත් 8 ගත්තේ නැහැයි කියල. ඒ ගැන පොඩ්ඩක් පැහැදිලි කිරීමක් කරන්න පුළුවන් නම් බොහොම පිං ස්වාමීවහන්ස තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - එතන එහෙම ගන්නේ ඒකට හේතුවක් තිබෙනවා. සංසාරය ගැන සලකන කොට චතුරාර්යසත්‍ය ධර්ම ගණන් ගන්නවනේ - ආර්යසත්‍ය ධර්ම 4 ක්. දුක්ඛ - සමුදය - නිරෝධ - මාර්ගය කියල. ඒ දුක්ඛ - සමුදය - නිරෝධ - මාර්ගය කියන කොටස් හතර සලකන්නේ සිත් 81 නුත් ඒ සමග යෙදෙන චෛතසික ධර්ම 52 කින් සහ රූප ධර්ම සමූහයෙන්. ඔය තමයි දුක් ගොඩ - දුක්ඛ - සමුදය - නිරෝධ - මාර්ගය. ඔය මාර්ග සිත් 4 යි - ඵල සිත් 4 යි චතුරාර්ය සත්‍යයට දාල සලකන්නේ නෑ. ඒකට කියනවා 'සච්ච විනිම්මුත්ත' - 'සත්‍යයෙන් අයින් කරපු ධර්ම' කියල. චතුරාර්ය සත්‍යයෙන් අයින් කරපු ධර්ම. කුසල ධර්ම හැටියට ගන්න කොට ඒක ගන්නවා. ඒක කුසල ධර්මයක්නේ. දැන් කුසලා ධම්මා - අකුසලා ධම්මා - අබ්‍යාකතා ධම්මා කියල ත්‍රිකයේ සලකන කොට ඒක සත්‍යධර්මය හැටියට මෙනෙයි සලකන්නේ. ත්‍රික ධර්ම හැටියට සලකන කොට එතැනදී ඔය ධර්ම ටික ගන්නවා. කුසල ධර්මයක්නේ. තව එකක් තියෙනවා කුසල ධර්ම බෙදීම ආකාර දෙකක් තිබෙනවා. අකුසල ධර්මනම් කෙලින්ම සංසාරයේනේ. ඒ ගැන කථා දෙකක් නෑ.

කුසල ධර්ම තියෙනවා ආකාර දෙකක්. එකක් තමයි ලෞකික කුසල ධර්ම විතරක් සැලකීම. එතකොට කුසල් සිත් 17 තියෙනවා. ඒ ටික විතරයි ගන්නේ. සාමාන්‍යයෙන් ලෞකික

කථාවක් නැතුව ඔක්කෝම කුසල් සිත් කියල ගත්තයින් පස්සේ ගන්නේ මාර්ග සිත් 4 ක් එක්ක 21 යි. ඒ තමයි කුසල ධර්ම. ඒක නිසාවෙන් ස්කන්ධ කථාවට ඔය සිත් 8 සම්බන්ධ කරගන්නේ නෑ. අනිත් ඒවා ඔක්කෝම සම්බන්ධ කර ගන්නවා. හැබැයි ඔය සංසාරයට ගන්න කොට. අනිත් එක සහජාත ධර්ම හැටියට ගන්න කොටනම් මේවා සලකනවා.

බොහොම පිං ස්වාමීන් වහන්ස

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස 'චිත්තචෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානා' කියල ගත්තහම දැන් ශරීරයේම හිරිගඩු පිපෙන්නෙ චිත්ත චෛතසික වලින්ද ස්වාමීන් වහන්ස ඒ විදියට තේරුම් ගත්තොත් හරිද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - අපේ ශරීරයේ හිරිගඩු පිපෙනවා කියල කියන්නේ, ඒ හිරිගඩු පිපෙන සිතක් තියෙන්න එපාය. සමහර විට සතුට නිසා හිරිගඩු පිපෙනවා සමහර වෙලාවට බයක් වෙච්ච හින්ද හිරිගඩු පිපෙනවා. ආන්න ඒ වගේ ඇති වෙනවා සිත්නිසා හිරිගඩු පිපීම. තවත් එකක් weather එක නිසාත් ඇතිවෙනවා. එක ඍතුජයි. හැබැයි මෙතැන හිරිගඩු පිපීම බය නිසා - සන්තෝසය නිසා - උද්දාමය නිසා ඇතිවෙන්න පුළුවන්. අනිත් එක තමයි කඳුළු ඒම. දැන් මනුස්සයෙකුට දුකක් ඇතිවෙනවා - මෙන්න ඇහෙන් කඳුළු ගලනවා. ඒවා ඇවිල්ල චිත්තජ රූප. ඒවගේම සමහර වෙලාවට හිනා යනවා. ඒවා චිත්තජ රූප. ඒ විදියට තමයි චිත්තචෙතසිකා ධම්මා චිත්තසමුට්ඨාන රූප ධර්මයන් සහජාතයි කියල කියන්නේ. තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස එතකොට නිස්සය පච්චයේදී 'මහාභූතා උපාදාරූපානං' කියල ගන්නවා. ඒක මෙතනදී ගැනෙන්නේ නැත්ද සවාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - ඔව් ඒක මම අත ගැහුවේ නැත්තේ තව ටිකක් මේක විස්තර කරන්න ඕන නිසා. මේකේ තව තියෙනවා ඉස්සරහට කියල දෙන්ට ටිකක්. මම ඒක නිසා පේළි හතරයි ඉදිරිපත් කරගත්තේ. අපි ඉස්සරහදි ඒක කියල දෙනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස නිර්වාණයේදී හේතුඵල ධර්මයන් ක්‍රියාත්මක වෙයි කියන එක මේ අවස්ථාවේ සුදුසුනම් පොඩ්ඩක් පැහැදිලි කරලා දෙනවානම් බොහොම පිං. තෙරුවන් සරණයි !

<u>පිළිතුර</u> - නිර්වාණයේ හේතු නෑ ඵල නෑ. යම් කිසි තැනක හේතු තිබෙනවා නම් ඵල තිබෙනවා. ඒ තමයි සංසාරය. කවදාකවත් නිර්වාණ ධාතුවේ හේතුවකුත් නෑ ඵලයකුත් නෑ. ඒක නිසා කියනවා ඒකට වෙන නමක්. අහල ඇති 'සංඛත ධර්ම' 'අසංඛත ධර්ම' කියල. සංඛත ධර්ම කියල කියන්නේ හේතුවලින් හට ගන්න ධර්ම සහ හේතු වශයන් ඉදිරිපත්වෙන ධර්ම වලට කියනවා සංඛත ධර්ම කියල. ඒවා තමයි ඔය හේතු ඵල ධර්ම හැටියට තවත් නමකින් කියන්නේ. සංඛත ධර්ම. චිත්ත චෛතසික රූප ඇවිල්ල සංඛත ධර්මයෝ. නිර්වාණ ධාතුවට කියනවා හේතුවකින් හටගන්නේ නැති - ඵලයක් නොවන - කවදාකවත්ම නිවන සිතින් හට ගත්ත එකක් නෙවෙයි. නිවන චෛතසිකයන්ගෙන් හටගත්ත එකක් නෙමෙයි. නිවන රූපයන්ගෙන් හට ගත්ත එකක් නෙමෙයි. නිවන කියන එක හේතු වලින් හටගත්තේ නැති

හින්දම හේතු කථාවක් නෑ. ඒක පවතින්නාවූ නිච්ච්ච ස්වභාවයක්. නිච්ච්ච ගුණයක් කිසිම හේතුවක් ඵලයක් වැඩ කරන්නේ නැති - හිතකුත් නැති - චෛතසිකත් නැති - සෝභනත් නැති - අසෝභනත් නැති - රූපත් නැති - මොකාක්වත්ම නැති චිත්ත චෛතසික ධර්ම - සංඛත ධර්ම මොකක්වත් නැති තැනක් වන නිසා ඒකට කියනවා අසංඛත ධර්මය - අසංඛත ධාතුව කියල. ඒක නිසා නිවනේ හේතු නෑ ඵල නෑ - ඒක හේතු ඵල ධර්මයන්ගෙන් සම්පූර්ණයෙන්ම මිදිච්චම මිදිච්චම - සෞම්‍ය වෙච්ච අති පාරිසුද්ධ වූ ධර්මස්වභාවයක්. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අපි කලින් කථා කරපු ප්‍රත්‍යය ගැනයි කථා කරන්නේ සමා වෙන්න ඕන ඒකට. සවාමීන්වහන්ස අපි කිව්වා අරහන්ත චුති සිත කියන එක කිසිම සිතකට අනන්තර ප්‍රත්‍යය යෙන් ප්‍රත්‍යය වෙන්නේ නෑ කියල මොකද එතැනින් එහාට සිත් පරම්පරාව නවතින නිසා. එතැන සංසාරයම කෙලවර වන නිසා. ස්වාමීන්වහන්ස ප්‍රශ්නයක් මතු උනා සමසීසී රහතන් වහන්සේගේ චුති සිත ඇතිවෙන්නේ කොහොමද කියල. අපි සාමාන්‍යයෙන් කථා කරන කොට කියන්නේ රහත් වීමත් පිරිනිවන්පෑමත් දෙක එක වෙලාවේ සිද්ධ වෙනවා කියල. ඒගැන කෙටියෙන් අදහසක් කියන්න පුළුවන් නම් බොහොම පිං ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - සමහර අය සමසීසී කියන ගුණය කියන එක තේරුම් අරගෙන තිබෙනවා වැරදි විදියට. ඒක නිසා මේ විදියට තේරුම් ගන්න එක හොඳයි. දැන් බලන්ට අවුරුදු හතේ කෙනෙක් රහත් වෙනකොටත් අවුරුදු 20 ක කෙනෙක් රහත් වෙන කොටත් අවුරුද 35 ක කෙනෙක් රහත් වෙන කොටත් අවුරුදු 50 එක්කෙනෙක් රහත් වෙන කොටත් අවුරුදු 80 – 90 ක් වෙලා රහත් වෙන කොටත් ඒ රහත් වෙන එක්කෙනාට කවදාවත්ම රහත් මාර්ග සිතක් - ඵල සිතක් හට ගන්නේ නැතුව රහත් වෙන්නේ නෑ. ඒකනිසා මාර්ග චිත්ත වීථියක් අනිවාර්යෙන්ම ක්‍රියාත්මක වෙන්ට ඕනෑ ඒ කෙනාට සංස්කාර පේන්ට ඕනෑ. සංස්කාර පේන්ට ඕනෑ - සංස්කාරයන්ගේ දුක දැනෙන්ට ඕනෑ - සංස්කාරයන්ගේ අනිත්‍ය දැනෙන්ට ඕනෑ - සංස්කාරයන්ගේ අනාත්මය දකින්ට ඕනෑ. ඕක විපස්සනා ගුණය. එතකොට ඒ විපස්සනා ගුණය දැකල තමයි - විපස්සනා සංස්කාරයන්ගේ ලක්ෂණ දැකල තමයි - ඒ බැලීමේ අනුභාවයෙන් ඒ විදර්ශනා ගුණය ඇතිවීමේ ප්‍රතිඵලයක් හැටියට ඉස්සරහට ගිහිල්ලා - අනුලෝම සිත් පහළ වෙනවා - ගෝත්‍රභූ - මාර්ග ඵල සිත් පහළ වෙනවා. මම මේ කථා කරන්නේ රහත් හිත. කවදාකවත්ම කෙනෙක්ගේ හිතක රහත් මාර්ග චිත්ත වීථිය පහළ වෙන්නේ නෑ අනාගාමී චිත්ත වීථිය යන්න කලින්. අනිවාර්යෙන්ම අනාගාමී චිත්ත වීථියක් යන්න ඕන. අනාගාමී චිත්ත වීථිය ගියාට පස්සේ තමයි භවංග කීපයකින් පස්සේ රහත් චිත්ත වීථි යන්නේ. අනාගාමී චිත්ත වීථිය යන්නේ නෑ සකෘදාගාමී චිත්ත වීථියක් යන්නේ නැතුව. සකෘදාගාමී චිත්ත වීථියක් යන්නේ නෑ සෝවාන් චිත්ත වීථියක් යන්නේ නැතුව. කවදාවකවත්ම මාර්ග skip කරන්නේ නෑ. ඵලය skip කරන්නේ නෑ. සෝවාන් සකෘදාගාමී අනාගාමී අරිහත් කියන මාර්ග සිත් - ඵල සිත් පහළ වෙන චිත්ත වීථි හතරක් පිළිවෙලකට යනවා. සමහර වෙලාවට ඒ මාර්ග චිත්ත විථියෙන් භවංග චිත්තක්ෂණ කීපයක් ගියාට පස්සේ සෝවාන් ඵලයට පස්සේ සකෘදාගාමී මාර්ග චිත්ත වීථිය ඊට පස්සේ අනාගාමී මාර්ග චිත්ත වීථිය ඊට පස්සේ අරහත් මාර්ග චිත්ත වීථිය. මේ සිත් පහළ වෙන කොට ඒ සිත් වලට

අනුකූලව චිත්තජ රූපත් පහළ වෙනවා. ඒ මාර්ග චිත්ත වීථි පහළ වෙනකොට ඒවාට අනුකූලව පහළවෙනවා චිත්තජ රූප. චිත්තජ රූප පහළ කිරීමේ හැකියාවකුත් ඔය සිත්වල තිබෙනවා. නිවන් අවබෝධ කිරීමේ ගුණ සවභාවයකුත් මහා ආනුභාව ස්වභාවයකුත් ඔය හිත්වල තියෙනවා. මේ සිත් අප්‍රාණික වෙච්ච - දුර්වල වෙච්ච ඒවා නෙවෙයි. හොඳට පන තියෙන ඕජා සම්පන්න - ධර්‍ම ඕජාව හොඳට පිරිච්ච - ඉතිරිච්ච - ශ්‍රද්ධා ගුණය තිබෙන සිත් පෙළවල් හතරක්. ඕව නැතුව නිවක් දකින්න බෑ.

දැන් බලමු මරණ චිත්ත වීථිය. මරණාසන්න චිත්ත වීථිය කියල කියන්නේ කර්මජ රූප පහළ වෙන්නේ නැති - ඒවාගේම චිත්තජ රූප හදාගන්නත් ඒ හැටි බැරි - දුර්වල වෙච්ච, ඒවාගේම කර්මජ රූපත් ඉක්මනට නතර කරපු චිත්තක්‍ෂණ 17 කට කලින්ම ඇති වෙච්ච ඒ වගේම අල්ල ගන්ට වැලක් නැතිව ඉන්න තැනක්. එතකොට දැන් මේ මරණාසන්න චිත්ත වීථියක අවසානය තමයි භවාංගය තියෙන්නේ. ඒ කියන්නේ භවංග හිතක් යනවා චුතිය නමින්. මේ දෙකේ පාරවල් දෙකක්නේ. මරණාසන්න චිත්ත වීථිය අවසන් වෙන්න යනවා ජීවිතේ චිත්තක්‍ෂණ 17 යි තියෙන්නේ - ඔය චිත්තක්‍ෂණ 17 දුර්වල වෙච්ච - හිතල බලන්න - දුර්වල වෙච්ච - පරණ වේගෙන යන - පන නැති වේගෙන යන ඒවගේම එල්ලෙන්න වැල නැතිව යන චිත්ත වීථියකට පුලුවන්ද නිවන් අවබෝධ කරගන්න. නිවන් අවබෝධ කරන්න හැකියාවක් තියෙනවද? නෑ. ඔය චිත්ත වීථි වර්ග දෙකක්. දැන් ඔය චිත්ත වීථියක - එනම් මැරෙන්ට යන චිත්ත වීථියකදී - චුති සිතකදී - තියෙන්නේ භවය අවසන් කරන එක මිසක නිවන් අවබෝධ කරන එකක් නෙමෙයි. ඒක නිසා මේ සමහර අය තේරුම් අරගෙන තියෙනවා මේ චුති සිත කියන එක සමසීසී කියල කියන්නේ නිවනුත් දකිනවා මැරිලත් යනවා කියල. ඕක ධර්‍ම විරෝධීයි. ධර්‍ම විරෝධී වෙන්නේ මැරෙන හිතින් නිවන් දකින්ට බෑ. නිවන් දකින හිතින් මැරෙන්ට බෑ. සෝවාන් වෙන හිතින් සකෘදාගාමී වෙන්න බෑ. සකෘදාගාමී වෙන හිතින් අනාගාමී වෙන්න බෑ. අනාගාමී වෙන හිතින් අරිහත් වෙන්න බෑ. ඒ එක හිතකින්වත් මැරෙන්ටත් බෑ. දැන් බලන්ට - තව එකක් මතු කරන්ට ඕන. චුති සිත, ප්‍රතිසන්ධි සිත මොකක්ද? අව්‍යාකෘත සිතක්. භවාංග සිත කියන්නේ මොකක්ද? අව්‍යාකෘත සිතක් - විපාකනේ. ප්‍රතිසන්ධි සිත අව්‍යාකෘත සිතක්. භවාංග සිත කියන්නේ මොකක්ද අව්‍යාකෘත සිතක් විපාකනේ. ප්‍රතිසන්ධි සිත අව්‍යාකෘත සිතක්. කුසලත් නමෙයි - අකුසලත් නෙමෙයි - ඒක විපාකයක්. ඊළඟට භවාංග සිත - කුසලත් නෙමෙයි - අකුසලත් නෙමෙයි - විපාක සිතක් - අව්‍යාකෘතයි. චුති සිත - කුසලත් නෙමෙයි - අකුසලත් නෙමෙයි - අව්‍යාකෘත සිතක්. කවදාකවත්ම අව්‍යාකෘත සිතකින් නිවන් අවබෝධ කරගන්නේ නෑ. දකින්ට බෑ. නිවන් දකින හිතට කියනවා කුසල් හිත කියනවා. මම කිව්වේ කුසල් හිත් 4 ක් තියෙනවනේ. හැබැයි එකක් තියෙනවා, ඒ කුසල් සිත් අපචය ගාමී. අපචයගාමී කියල කියන්නේ ප්‍රතිසන්ධි සිත් හදල දෙන්නේ නැහැ. සමහර කුසල් සිත් තියෙනවා ප්‍රතිසන්ධි සිත් හදල දෙන්න පුළුවන්. සමහර ඒවා තියෙනවා කුසල් සිතක් උනාට ප්‍රතිසන්ධි හදල දෙන්න බෑ. ඒක නිසා කියනවා ආචයගාමී සහ අපචය ගාමී කියල. මාර්ග සිත් හතර අපචය ගාමී. විපාක වශයෙන් ප්‍රතිසන්ධි හදන්නේ නෑ. දැන් මේ කථාව තේරෙනවනේ. ඒක නිසා ඔය සමසීසී කියන එකේ ඔය විදියට ඒක චිත්තකෂණිකව නිවන් දකිනවා - ඒක චිත්තක්ෂණිකව නිවන් දැක දැක මැරිලත් යනවා කියල භාර ගන්න එක ධර්‍ම විරෝධීයි. ඔහොම නෙමෙයි ඕක වෙන්නේ.

අපි හිතමු මෙහෙම. දැන් ඔන්න හාමුදුරුවෝ කෙනෙක් ඉන්නවා. ඒ ස්වාමීන්වහන්සේ භාවනා කරනවා - භාවනා කරනවා - හිත වැටෙනවා - ශ්‍රද්ධාව ගොඩ දාගන්නවා ආයි වැටෙනවා ඔහොම - ඔහොම - ඔහොම ගිහිල්ලා - දැන් විදර්ශනාව ටිකක් වෙනවා වැටෙනවා නැවත්ත විදර්ශනාව ටිකක් වෙනවා වැටෙනවා ඔහොමනෙ - දැන් ඔය සමහර අය ඉන්නව විදර්ශනා භාවනාවක් කර කර යනවා. විදර්ශනා භාවනා කරලා හොඳට ශ්‍රද්ධාවත් තියෙනවා. ඊළඟට පැය එකහමාර දෙක අපිත් එක්ක හොඳට වාඩි වෙලා ඉන්නව. ඒවගේම සංස්කාරයෝ අනිත්‍ය යයි කිය කියා ඉන්නවා. ඔන්න සතියකට විතර පස්සේ මගුල් ගෙදරක ගිහිල්ලා නටනවා. නටල ෆොටෝත් ගේනවා. ඔහොම අවස්ථා තියෙනවා. ඉතින් බලන්න සතිපට්ඨානය වඩමින් මගුල් ගෙවල් වල නටන්න පුලුවන්ද? ඊළඟට 'අතපී ඉමස්මිං' කිය කියා සිහියෙන් යුක්තව යන්න පුළුවන්ද? බෑ . එතනදී සිහිය වැටිලා. භාවනාවේදී සිහිය හොඳට අල්ලලා දෙනවා ශ්‍රද්ධාවත් එක්ක. ඔය වගේ අපේ හිත් විදර්ශනාවේ යන කොට වැටෙනවා - ගොඩවෙනවා. වැටෙනවා - ගොඩවෙනවා. ඔය විදියට තියෙනවා. ඔහොම භාවනා කර කර ඉන්න හාමුදුරුවෝ කෙනෙකුට - යෝගියෙකුට අල්ලනවා උණ සන්නිපාතයක්. උණ සන්නිපාතය ආවට පස්සේ හොඳටම අමාරුයි. හොඳටම අමාරුයි දැන් ඒ උණ සන්නිපාත ලෙඩේ. ඒ උණ සන්නිපාත ලෙඩේ ආවට පස්සේ ඒක දුකක්. ඒ දුක හොඳට මෙනෙහි කරනවා. මෙනෙහි කරලා කරලා ඒ උණ සන්නිපාතය හැදුනට පස්සේ ඒක ඇරෙන්නේ නෑ. උණ සන්නිපාතයෙන්ම ඒ හාමුදුරුවෝ අපවත් වෙනවා. උණ සන්නිපාතයම මෙනෙහි කරලා ඒකෙන් සතරමග සතර ඵල අවබෝධ කරගෙන - ධර්මය අවබෝධ කරගෙන නිවන් දකිනවා. නිවන් දකින්ටයි මැරිලා යන්ටයි දෙකටම හේතු උනේ උණ සන්නිපාතය හින්ද ඒක සමසීසී. ඊළඟට කෙනෙකුට බඩේ අමාරුවක් හැදෙනවා. දැන් එයාට හරියට බඩ රිදෙනවා. මේ බඩේ අමාරුව කවදාකවත් මොන බෙහෙතකටවත් ඇරෙන්නේ නෑ. මේ හාමුදුරුවෝ අපවත් වෙන්නෙත් බඩේඅමාරුවෙන්. ඒ බඩේ අමාරුව මෙනෙහි කරලා තමයි නිවන් දකින්නේ. ඒක නිසා නිවන් දකින්ටයි අපවත්වෙන්ටයි දෙකටම මේ බඩේ අමාරුව හේතු වෙච්ච හින්ද ඒකට කියනවා සමසීසී කියල. ඊළඟට අපි හිතමු කෙනෙක් බෙල්ල කපා ගත්තනේ. ඒ බෙල්ල කපා ගත්තට පස්සේ වේදනාවක් එනවා. ඒ වේදනාව දැනුන - බෙල්ල කපා ගත්තු එකෙන් ජීවිතේ නැතිවෙලා යනවා. බෙල්ල කපා ගත්තු එකෙන් ඒ වේදනාව මෙනෙහි කරලා සසර දුකින් මිදිලා සෝවාන් වෙනවා සකෘදාගාමී වෙනවා අනාගාමී අරහත් වෙනවා. මේ මාර්ග සිත් ඵල සිත් ඔක්කොමත් අවබෝධ කරගෙන සසර දුකෙනුත් මිදෙනවා, බෙල්ල කැපීමෙන් - මැරිලත් යනවා බෙල්ල කැපීමෙන්. ඒක නිසා එක සිද්ධියකින් බඩේ අමාරුව හෝ උණ සන්නිපාතය හෝ බෙල්ල කපා ගැනීම හෝ accident එකක් හෝ මොකක් හෝ වේවා එක දෙයකින් එක කාරණයක් හේතුවෙලා ජීවිතේන්ද්‍රිය උපච්ඡේද මරණයයි මානසික වශයෙන් ධර්ම අවබෝධය සිද්ධ වීමයි කියන එක, එක චිත්ත වීථියක - එක චිත්තක්ෂණයක වෙන එකක් නෙවෙයි. ඕක අස්සේ චිත්ත වීථි ගානක් යනවා. කෝටි ගානක් යනවා. හැබැයි පැති දෙකක්. ඒ දෙකටම හේතු උනේ එක කාරණයක් - එක සිද්ධියක් නිසයි කියන්නේ සමසීසී භාවය නැත්නම් එක සිද්ධියකින් නිවන් අවබෝධ කරගන්නවා - සමසීසී පරිනිර්වාණය

කියල. ඒකනිසා හරී පරෙස්සමෙන් මේ පින්වතුන් මේවා තේරුම් ගන්ට. හොඳට හිතන්න. සැම දෙනාටම ධර්ම අවබෝධය වේවා කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා.

සාධූ ! සාධූ! සාධූ ! බොහොම පිං ස්වාමීන්වහන්ස.

<u>ප්‍රශ්නයක්</u> - පොඩි ප්‍රශ්නයක් ස්වාමීන්වන්ස, කොහොමද ස්වාමීන්වහන්ස රහතන් වහන්සේ කෙනෙකුගේ මරණාසන්න චිත්ත වීථිය වැඩ කරන්නේ. පොත පතකවත් අපිට හොයා ගන්න නෑ. සමාපත්ති වලට සමවදිනවා කියල විතරයි තියෙන්නේ. ඒක පොඩ්ඩක් පැහැදිලි කරල දෙන්න ස්වාමීන් වහන්ස. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - සාමාන්‍යයෙන් රහතන් වහන්සේ නමකගේත් චිත්ත වීථියක් අර විදියම තමයි. ජවන් සිත් 5 කින් තමයි සකස් වෙන්නේ. අනිත් එක අර විදියමයි යන්නේ. තියෙන්නෙ රහතන්වහන්සේට බයක් තැතිගැනීමක් සාංකාවක් සෝකයක් මොකක්වත් නෑ. අනිත් එක තමයි ඒ චිත්ත වීථිය යන්න කලින් හොඳ සිහියෙන් ධර්ම දැක දැක හොඳට තියෙනවා. හැබැයි ඒ චිත්ත වීථිය අවසානයේදී ඇතිවන භවාංගය උන්වහන්සේගේ ඒ ජීවිතයේ හටගත්ත ප්‍රතිසන්ධි සිතට සමාන හිතකින් තමයි උන්වහන්සේ ඒ ජීවිතයෙන් අතහැරෙන්නේ. ඒ චිත්ත වීථියේ රහතන් වහන්සේලාට කියල එහෙම අමුතු එකක් නෑ. ඒ යන චිත්ත නියාමය නියාමයමයි. එච්චරයි. තෙරුවන් සරණයි!

බොහොම පිං ස්වාමීන්වහන්ස !

<u>ජයන්ත මහතා</u> - එහෙමනම් ස්වාමීන්වහන්ස අද දවසේ සාකච්ඡාව නිමා කිරීමට ඔබ වහන්සේට යොමු වෙනවා. අදත් අප වෙනුවෙන් මේ වගේ කාලයක් වැය කරලා මේ ධර්ම කරුණු මතු කර දීම පිළිබඳව ඔබවහන්සේට අනන්ත අප්‍රමාණ පිං. මේ සියලු කුසලයන් ඔබවහන්සේට අනුමෝදන් කරනවා. ඔබවහන්සේටම යොමුවෙනවා මේ සාකච්ඡාව නිමා කරන ලෙසට. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - හොඳයි සැම දෙනාටම තෙරුවන් සරණයි! මේ පින්වතුන් ඉතින් අප කෙරෙහි මේ සද්දයට හිත යොදාගෙන බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තියෙන ධර්මය අහගන්ට හිත යොදාගෙන හිටිය. සැම දෙනාටම ගොඩක් කුසල් සිද්ධ උනා. ඉතින් අපි මේ ධර්මය ඇසීමෙන් ධර්මය කීමෙන් අපි ලොව්තුරා බුදුරජාණන්වහන්සේට නමස්කාර කිරීමක් ගරුකිරීමක් වන්දනාවක් සිද්ධ කරන්නේ. ඒ වාගේම උන්වහන්සේලා බොහෝම අමාරුවෙන් ලෝකයට විවර කරාවූ ධර්මය - ධර්මය හොයාගෙන යන්නාවූ පිරිසකට දැනුමේ ප්‍රමාණයේ හැටියට අපේ ශක්ති ප්‍රමාණයෙන් ඉදිරිපත් කරල ඒවාගේම පිහිට වීමක් පමණයි මේ සිද්ධ කරන්නේ. ඒක නිසා ඒ ලොව්තුරා බුදුරජාණන්වහන්සේලාගේ ධර්මය ලෝකයට කියාදීම ඇසීම නිසා තව මේ ධර්මය ජීවමාන කරනවා. සජීවී කරනවා. ලෝකයට විවර කරල දෙනවා. ඉතින් මේ කටයුතු සිද්ධ කරගන්ට බොහෝම උදව් උනාවූ උපකාරවෙන පිංවත් ලලිත් දළුවත්ත මහත්මයාටත් ඒවගේම අද ධර්ම වැඩසටහන මෙහෙය වූවාවූ ඒ පිංවත් ජයන්ත මහත්මයාටත් ප්‍රශ්න අසපු අපේ පිංවත් මහත්මයල මහත්මීන් සැම දෙනාටමත් අසාගෙන සිටියාවූ සැම සියලු දෙනාටමත් ඒකාන්තයෙන්ම නිදුක් නිරෝගී දීර්ඝායුෂ වේවා! දුකක් කරදරයක් නැතිව සැපසේ ධර්ම අවබෝධය ඇති කරගන්ට ධර්ම මාර්ගයේ ගමන්

කරන්ට ශක්තිය ලැබේවා! කෙලෙසුන්ගෙන් හිත් මිදේවා! ශ්‍රද්ධාදී ගුණ ධර්මයන්ගෙන් හිත් වැඩේවා! මේරීමට පත්වේවා! ඒවාගේම මේ ධර්ම මාර්ගයේ පුරෝගාමීත්වයෙන් කටයුතු කරන පිංවත් ලලිත් දළුවත්ත මහත්මයාට නිදුක් නිරෝගී දීර්ඝායුෂ වේවා! ඒ මහත්මයාට ඒකාන්තයෙන්ම අපේ මේ පිං බලයෙන් කුසල් බලයෙන් නිරෝගී භාවය වහ වහාම ලැබේවා කියල අපි සාධු කියල ප්‍රාර්ථනා කරමු ආශීර්වාද කරමු. මේ පිංවත් සැම දෙනාටම මේ උතුම් පිං බලයෙන් අපි මතක් කරපු විදියට සූක්ෂම වූ - ප්‍රනීත වූ - අසංඛත වූ - සුමධුර වූ - ශාන්ත වූ - කෙලෙසුන්ගෙන් නිරෝගී භාවය උපරියෙන්ම තිබෙන්නාවූ - හේතු ඵල ධර්මයන්ගෙන් මිශ්‍රතාවයක් නැත්තාවූ නිර්වාණ ධාතුව සැමදෙනාටම සුවසේම අවබෝධ වේවා! නිවන් පිණිස මේ කුසල් මේ පිං හේතු හේතු වාසනා වේවා කියා මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.